# 13 විධිමත් ව වැය කරමු

අප තිලෝගුරු බුදුපියාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වසන සමයේ සිදු වූ එක් රසවත් සිද්ධියක් ඇත. එනම්, එකල සිටි උදේන රජු හා ආනන්ද හිමියන් අතර ඇති වූ වස්ත්‍ර පරිහරණය පිළිබඳ සාකච්ඡාවයි.

දිනක් උදේන රජතුමාට තෑගි පිණිස වටිනා වස්ත්‍ර දහසක් ලැබිණ. රජතුමා ඉන් පන්සියයක් තමන්ගේ අන්තඃපුර බිසෝවරුන් පන්සිය දෙනාට බෙදා දුන්නේ ය. ඉතිරිය රාජකීය ගබඩාවේ තැන්පත් කරන ලදී.

මේ බිසෝවරුන්ට ධර්ම දේශනා කිරීම පිණිස ආනන්ද හිමියෝ නිතර අන්තඃපුරයට වැඩම කරති. එසේ වැඩම කළ එක් අවස්ථාවක දී එම බිසෝවරු පන්සිය දෙනා ම රජු තෑගි කළ වස්ත්‍ර උන්වහන්සේට පූජා කළහ. ආනන්ද හිමියෝ ද එම වස්ත්‍ර සියල්ල ම පිළිගත්හ.

අන්තඃපුරයට ගිය අවස්ථාවේ බිසෝවරුන් එක් වස්ත්‍රයක් හැඳ සිටිනවා දැක තමා දුන් උතුරුසළු කොහිදැයි රජතුමා විමසී ය. එවිට ඒවා ආනන්ද හිමිට පූජා කළ බව බිසෝවරු කීවෝ ය. රජතුමා විමසන්නේ එම වස්ත්‍ර පන්සියය ම ආනන්ද හිමියන් පිළිගත්තේ ද යන්නයි. එම වස්ත්‍ර පන්සියය ම ආනන්ද හිමියන් පිළිගත් බව ඇසූ රජතුමාට පුදුමයක් ඇති විය. බුදුරජාණන් වහන්සේ භික්ෂූන්ට අනුදැන වදාරා ඇත්තේ තුන් සිවුර පමණක් වුව ද ආනන්ද හිමියන් මෙසේ වස්ත්‍ර පන්සියයක් පිළිගැනීම විනය විරෝධී ක්‍රියාවෙකැ යි හෙතෙම සිතුවේ ය. එසේ සිතූ එතුමා ආනන්ද හිමියන් හමුවන්නට ගියේ ය.

ආනන්ද හිමියන් හමු වූ රජු විමසන්නේ 'ස්වාමීනි, ඔබ වහන්සේ මාගේ අන්තඃපුර බිසෝවරුන් පන්සියයක් දෙනා පූජා කළ වස්ත්‍ර සියල්ල පිළිගත්තේ ද? ' යන්නයි. එය සත්‍ය බව දැනගත් රජතුමා නැවත විමසන්නේ "ඔබ වහන්සේ වස්ත්‍ර රාශියකින් කුමක් කරන්නේ ද?" යන්නයි.

මෙයට පිළිතුරු දෙන අනඳ හිමියෝ "මහරජ අපට ප්‍රමාණවත් වස්ත්‍ර රැගෙන අනෙක් ඒවා දිරාගිය සිවුරු ඇති භික්ෂූන්ට දෙම්හ" යි පැවසූහ.

රජු විමසන්නේ "එවිට මෙතෙක් ඒ හිමිවරු හැඳි සිවුරු කුමක් කරන්නේ ද?" යන්නයි. "මහරජ එම භික්ෂූන් වහන්සේ තම පරණ සිවුරු ඊටත් වඩා දිරාගිය සිවුරු දරන අයට දෙති" යි ආනන්ද හිමියෝ පැවසූහ.

"ස්වාමීනි, එවිට ඒ වඩාත් දිරාගිය සිවුරුවලට කරන්නේ කුමක් ද?"

"මහරජ, එම සිවුරු ඇඳ ඇතිරිලි පිණිස යොදා ගනිමු."

"ස්වාමීනි, මෙතෙක් පැවති ඇඳ ඇතිරිලිවලට කරන්නේ කුමක් ද?"

"මහරජ, අපි එම ඇඳ ඇතිරිලි, බුමුතුරුණු සඳහා යොදා ගන්නෙමු."

"ස්වාමීනි,  එවිට මෙතෙක් පැවති බුමුතුරුණුවලට කරන්නේ කුමක් ද?."

"මහරජ පරණ බුමුතුරුණු, පාපිසිවලට පාවිච්චි කරමු."

"පැරණි පාපිසිවලට කරන්නේ කුමක් ද ස්වාමීනි."

"මහරජ, අපි දායකයන් පූජා කරන දෙය නිකරුණේ  නාස්ති නො කරමු. එම පැරණි පාපිසි කුඩා කැබලි ලෙස කොටා මැටි සමඟ කලවම් කර පන්සල් බිත්තිවල ආලේප කරමු'යි ප්‍රකාශ කළහ.

මෙම ක්‍රියා පිළිවෙල ගැන අසා සිටි උදේන රජතුමාට ඉතාමත් සතුටක් ඇතිවිය. රජතුමා සම්පත් ප්‍රයෝජනයට ගන්නා ක්‍රමය පිළිබඳ සතුටට පත් වී තමා සතු ඉතිරි වස්ත්‍ර පන්සියය ද ආනන්ද හිමියන්ට පූජා කළේ ය. මෙබඳු ම සංවාදයක් අනඳ හිමි සහ කොසොල් රජු අතර ද සිදු වී ඇත.

ඉහත සඳහන් කතා පුවත විමසා බැලීමේ දී පන්සල්වල සාංඝික දේපළ තනි ව නො ව සියලු දෙනා වහන්සේලා බෙදාගෙන පරිහරණය කරන අයුරු පෙනී යයි. එසේ ම අපට ලැබෙන කවර දෙයක් වුව ද විනාශ කිරීම නොකළ යුතු බවත්, ඒවා සැලසුම් සහගත ව පරිහරණය කළ යුතු බවත් අපට කියා දෙයි.


අපට ලැබෙන ධනය වියදම් කිරීමට සුදුසු ක්‍රමෝපායන් පිළිබඳ ව ද බුදු සමය පෙන්වා දී ඇත. දිනක් බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රයේ දී අප ධනය වියදම් කළ යුතු අයුරු මෙසේ පෙන්වා දුන්හ.

"ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය
ද්වීහි කම්මං පයෝජයේ,
චතුත්ථං ච නිධාපෙය්‍ය
ආපදාසු භවිස්සති."

(සිගාලෝවාද සූත්‍රය)

තේරුම:-

තමාට ලැබෙන ධනය කොටස් හතරකට බෙදා ගත යුතු ය. ඉන් එක් කොටසක් පරිභෝජනය සඳහා ද, කොටස් දෙකක් සිය කර්මාන්තයේ දියුණුව සඳහා ද, ඉතිරි කොටස ආපදාවක දී ගැනීමට තැන්පත් කර තැබීම සඳහා ද යොදා ගත යුතු ය.




ඉහත සඳහන් ආකාරයට අපට ලැබෙන ආදායම් කොටස් කර ගත යුතු ය. එසේ නොමැති ව කෙනකු තමාට ලැබෙන මුළු මුදල ම වියදම් කරයි නම්, එවිට හදිසි ආපදාවක් ඇති වූ විට අපට ණය වීමට සිදුවෙයි. එහි දී දැඩි අපහසුතාවන්ට ලක්වීමට ද ඉඩ ඇත.

මේ අනුව මුදල් වුව ද, අපට එදිනෙදා ජීවිතයේ දී ලැබෙන අතිකුත් සම්පත් ආදිය ද එසේ කළමනාකරණය කර ගත යුතු ය.

තමාට ලැබෙන සියලු මිල මුදල් සම්පත් ආදිය ආශාවෙන් රැස්කර දනට පිනට නොදී පරිභෝග නොකර සිටීම ද බුදුසමය ප්‍රතික්ෂේප කරයි. තමාට ලැබෙන දේ මනාව පරිහරණය කළ යුතු ය. දනට පිනට දිය යුතු ය. පරිභෝග කළ යුතු ය. ආරක්ෂා කළ හැකි දේ ආරක්ෂා කොට තැබිය යුතු ය. ඒ මතුවට ප්‍රයෝජන ගැනීමටයි.

බුදුරජාණන් වහන්සේ විසින් පුද්ගලයකුගේ මෙලොව ජීවිතය සැපවත් කර ගත හැකි ක්‍රියාමාර්ග හතරක් දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| 1. | උට්ඨාන සම්පදා | - | උත්සාහ සම්පත්තිය |
| 2. | ආරක්ඛ සම්පදා | - | ආරක්ෂා සම්පත්තිය |
| 3. | කල්‍යාණමිත්තතා | - | කල්‍යාණ මිත්‍ර සම්පත්තිය |
| 4. | සමජීවිකතා | - | අය වැය සම ව පවත්වා ගැනීම |

හැදෙන වැඩෙන දරුවන් ලෙස අප ද මෙසේ අප සතු සම්පත් මනා කළමනාකරණයක් ඇති ව පරිහරණය කළ යුතු ය. එහි දී පළමු සම්පත්තිය ලෙස දක්වන ලද්දේ උට්ඨාන සම්පදාව හෙවත් උත්සාහ සම්පත්තියයි. ඉගෙන ගන්නා දරුවන් වන අප නිතර ම උත්සාහවත් විය යුතු ය. අධ්‍යාපන කටයුතු සඳහා උත්සාහයෙන් වැඩ කිරීම තුළින් අපට සාර්ථක ප්‍රතිඵල ළඟා කර ගැනීමේ හැකියාව ඇත.

මෙහි දී දෙවන සම්පත්තිය ලෙස පෙන්වා දෙන ලද්දේ ආරක්ඛ සම්පදාව හෙවත් ආරක්ෂා සම්පත්තියයි. අප සතු සම්පත් ආරක්ෂා කර ගැනීමයි. තමා සතු පෞද්ගලික දේ සේ ම අපගේ පොදු දේපළ ද අප ආරක්ෂා කිරීමට පුරුදු විය යුතු ය.

අප කියවන මේ පොත පිළිබඳ ව මඳක් සිතා බලමු. මෙය අපට රජයෙන් ලබාදෙන්නේ නොමිලේ ය. මෙය හොඳින් ආරක්ෂා කිරීම අපසතු යුතුකමක් නොවන්නේ ද? අප මෙය හොඳින් ආරක්ෂා කර ලබන වසරේ තවත් ළමයකුට ඉගෙනීමට ලබා දීම අප සතු යුතුකමකි.

මව්පියන් ඉතා දුක් මහන්සි වී අපට සපයා දෙන පොත්පත් ඉගෙනීම් උපකරණ, ක්‍රීඩා භාණ්ඩ, මෙන් ම ඇඳුම් පැළඳුම් ද හොඳින් ආරක්ෂා කිරීමට අප කටයුතු කළ යුතු ය.

පාසලේ, පන්සලේ, රෝහලේ, බස් නැවතුමේ, දුම්රියපොළේ හා වෙනත් පොදු ස්ථානවල ඇති සම්පත් ආරක්ෂා කිරීමට ද අප පුරුදු විය යුතු ය. පරණ වූ ලී බඩු ආදිය ඇත්නම් ඒවා නැවත පරිහරණය කළ හැකි පරිදි ආරක්ෂා කළ යුතු ය. ඒ අනුව ආරක්ඛ සම්පදාව අප ජීවිතයට ඉතා ම වැදගත් වන කරුණකි.

අපගේ ජීවිතය වාසනාවන්ත කර ගැනීමට බලපාන අනෙක් වැදගත් කරුණ වන්නේ කල්‍යාණ මිත්‍ර සම්පත්තිය හෙවත් යහපත් මිත්‍ර සේවනයයි. අපගේ මෙලොව පරලොව දෙලොව ජීවිතය ම වාසනාවන්ත කර ගැනීමට අප යහපත් මිතුරන් ඇසුරු කිරීමට පුරුදු විය යුතු ය. සම්පත් පරිහරණයේ දී පාපමිත්‍ර ඇසුර අහිතකර ලෙස බලපාන බව තේරුම් ගත යුතු ය.

මෙලොව දිවියේ සාර්ථකත්වයට බලපාන සිව්වන කරුණ නම් සම ව දිවි පැවැත්මයි. තමාට ලැබෙන දේ තමා සතු දේ නිසි පරිදි කළමනාකරණය කර ගැනීම මෙහි දී ඉගැන්වේ. මෙහි දී බුදුරජාණන් වහන්සේ පුද්ගලයින් දෙදෙනකු ගැන සඳහන් කරති.

1. තුලාධාරික පුද්ගලයා
2. උදුම්බරඛාදික පුද්ගලයා

**තුලාධාරික** පුද්ගලයා යනු තමාගේ අය වැය දන ගෙන තරාදියේ දෙපැත්ත සම ව තබා ගන්නා සේ සම ව වියදම් කරන පුද්ගලයා ය. ඔහු තමාගේ ආදායමට අනුව වියදම සකස් කර ගනී. සාර්ථක ලෙස ජීවිකාව ගෙවයි.

**උදුම්බරඛාදික** පුද්ගලයා යනු තමාගේ අය පිළිබඳ ව නොසිතා වැය කරන්නා ය. ඔහු තමාට දිවුල් කෑමට අවශ්‍ය වූ විට ගසේ අතු කඩා දිවුල් කන්නකු ලෙස දක්වා ඇත. තමාගේ අවශ්‍යතාව එම අවස්ථාවට සම්පූර්ණ වුව ද ඒ හේතුවෙන් පසු ව පසුතැවීමට සිදු වේ. ඒ හෙටක් ගැන නොසිතා කටයුතු කළ බැවිනි.

ඒ අනුව අප උදුම්බරඛාදිකයන් නො විය යුතු ය. වියදම් කරන දේ මෙලොව යහපත පිණිස පවතී ද යන්න පිළිබඳ ව විමසා බැලිය යුතු ය. දුරාචාරවලට මෙන් ම නොවැදගත් දේට මුදල් වියදම් කිරීම නො කළ යුතු ය. එසේ නම් අපි මව්පියන්ට කරදර නො කරන, පොදු දේපළ ආරක්ෂා කරන, සම්පත් මනාව පරිහරණය කරන හොඳ දරුවන් පිරිසක් ලෙස කටයුතු කිරීමට අදිටන් කර ගනිමු.

**සාරාංශය**

සමාජයේ බොහෝ දෙනාගේ දිළිඳු බවට හේතු වී ඇත්තේ ඔවුන් සතු ව නිවැරදි ධන සම්පත් පරිහරණයක් නොමැතිකමයි. සමහර කෙනෙක් ලැබෙන මුළු ආදායම වියදම් කර අනුභව කරති. තවත් කෙනෙක් ණය වී වියදම් කරති. හෙට දිනයක් පිළිබඳ ව නො සිතති. තමා සතු අනෙකුත් සම්පත් ආදිය ද මේ ආකාරයට නිසි කළමනාකරණයක් නොමැති ව පරිහරණය කිරීම බුදුසමය ප්‍රතික්ෂේප කර ඇත. තමාට ලැබෙන සම්පත් නිසි අයුරින් පරිහරණය කරන අයුරු දක්වෙන උපදෙස් රැසක් බුදුසමයෙහි එයි.

**ක්‍රියාකාරකම**

1. **ඒකේන භෝගේ භුඤ්ජෙය්‍ය....** යන ගාථාව ශබ්ද නගා කියවන්න.
2. අපට ලැබෙන ධනය කොටස් කර පරිහරණය කරන අයුරු ලියන්න.
3. සමජීවිකතාව පිළිබඳ ව පන්තියේ දී කථාවක් පවත්වන්න.
4. ඔබේ අධ්‍යාපනික උපකරණ පරිහරණයේ දී සහ නඩත්තුවේ දී ඔබ සැලකිල්ලට ගන්නා කරුණු ලියා දක්වන්න.

**පැවරුම**

ආනන්ද හිමියන් හා උදේන රජු අතර ඇති වූ සංවාදය රඟ දක්වන්න.